



අපූරු ස්ථානයකි. ත්‍රිකුණාමලයේ සිට කි.මී. 16 ක් පමණ දුරින් නිලාවැලි මුහුදු තීරය පිහිටා ඇත. ඒ වෙත කොළඹ සිට දුර කි.මී. 275 කි. ආසියාවේ දූෂණය නොවූ සුන්දරම වෙරළක් ලෙස විදෙස් සංචාරකයන් අතර ප්‍රකටව ඇත. සුදු පැහැති වැලි තලාව ද නිල් පැහැති සමුද්‍ර ද මේ සුන්දරත්වය ඔපවත් කරයි. උදේ ආහාරයෙන් පසු අපේ අදහස වූයේ වෙරළට සුන්දර ලෙස දිස්වන පරෙවි දූපත නැරඹීමට යාම සහ ජාතික උද්‍යානයන් වන මෙහි පාලනය වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ය. නිලාවැලි වෙරළේ සිට දූපත වෙත යාමට බෝට්ටු සේවා යොදවා තිබේ.

නිල වර්ණ ආකාශයෙන් මුහුදත් එක් වන තීරයේ පිහිටි පරෙවි දූපත දැන් අපට පැහැදිලිව පෙනේ. එය වෙරළේදී දුටුවාට වඩා වෙනස් ව දිස්වේ. මුලදී අප දුටු එක එකට පිහිටි කඳු ගැට දෙක දූපත් දෙකකි මුලින්ම ඇති දූපතට එපිටින් පරෙවි දූපත පිහිටා ඇත්තේ වෙරළේ සිට කි.මී. 1 . 5 ක් පමණ දුරින් පිහිටි මේ වෙතට විනාඩි 20 ක පමණ බෝට්ටු ගමනකින් පිවිසිය හැකි ය.

මෙහි මුලින්ම අභය භූමියක් පිහිටුවීමේ අරමුණ එහි නේවාසිකයන් වන ගල් පරෙවියන්ට ආරක්ෂාව සැපයීමයි. පසුව 2003 දී එය ජාතික උද්‍යානයක් බවට පත් කළේය. දූපතේ ඇති කුඩා වෙරළේ සංචාරක බෝට්ටු කිහිපයක්ම නවතා ඇත. උතුරු දකුණු විහිදෙන කඳුගැට දෙකකින් යුක්ත මෙහි උතුරු කෙළවර උසින් අඩි 100 ක් කරම් වේ. දූපත් වෙරළ පිහිටියේ බටහිර ප්‍රදේශයේ ය. දූපත සම්පූර්ණයෙන් ම විවිධ හැඩැති ගල්පර්වත වලින් පිරී පවතී. තැන තැන කුට්ටි වශයෙන් ශුෂ්ක කලාපීය පඳුරු පැතිරී ඇත. නැගෙනහිර ප්‍රදේශයේ ඇති කුඩා බොක්ක නිසා ඉතා අලංකාර දර්ශනයක් මැවේ.

කොරල්පර දූපත වටා පිහිටා ඇත. නොගැඹුරු මුහුද පැහැදිලිය. ලා නිල් පැහැයකින් යුක්තය. හිරු එළිය වැටී මුහුද බබළයි.

විදේශිකයන් සහ දේශීය සංචාරකයන් රැසක් බොක්ක අවට මුහුදේ පිහිනමින් සතුටු වෙති. කිමිදීම සඳහා ද මේ අවට මුහුද ජනප්‍රිය වී ඇත. දූපත් වෙරළේ සිප්පිකටු හා විවිධ ප්‍රමාණයේ හක්බෙල්ලන් දැකගත හැකිය. මෙම බෙල්ලන් වසර සිය ගණනාවක් තිස්සේ එකතුවීමෙන් ගොඩ ගැසී ඇත.

මෙහි ගල්පර අතර බහුලව වාසය කරන පරෙවි රංචු ඉතා අපූරු දර්ශනයකි. පරෙවියන් ඉතා නිදහසේ තමන්ට වෙන්වූ අභයභූමියේ සැරිසරනු පෙනිණි. දීර්ඝ කාලයක පටන් මෙම භූමිය උන්ගේ නිජබිම වී ඇත. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙම දූපත ඉංග්‍රීසි හමුදාවේ වෙඩි තැබීම් පුහුණු වන ස්ථානයක් ලෙස තිබී ඇත. ඒ අවධියේ සෙහි පරෙවියන් ඔවුන්ගේ වෙඩි උණ්ඩයට ගොදුරු වන්නට ඇත. ගෘහකරණය නොවූ මෙම පරෙවියන්ගේ අභිජනන ස්ථානය වශයෙන් පරෙවි දූපත වැදගත් ය. මෙහි වාසය කරන්නේ ගල් පරෙවියා (Colomba Livia ) සුදු නිල් අළු පැහැයෙන් යුත් සිරුරකින් යුත් උගේ පියාපත්වල කළු පැහැති තීරු දෙකකි. බෙල්ල අඳුරු පැහැති ය. මෙම පක්ෂීන් ඉතා කුලෑටි වනගත පරෙවියෝ වෙති. වර්ෂ 2000 දී මෙහි ගල් පරෙවියන් 150 ක් පමණ නිරීක්ෂණය කළහැකි විය.ඔවුන් ගොඩබිම සමග සබඳකම් නොපවත්වන අතර, දූපත තුළම ජීවිතය ගෙනයයි. පසුකාලීනව මෙම දූපතට ගොඩබිම සිට කපුටන් සංක්‍රමණය වී ඇත. සංචාරකයන් ඉවත දමන කෑම ආදිය ආහාරයට ගැනීමට හැකිවීම කපුටන් මෙහි පැමිණීමට හේතු වී ඇත. එය පරෙවියන්ට හානිකරය. උන්ගේ පැටවුන්ට හානි කිරීම බිත්තරවලට හානි කිරීම ආදිය කපුටන් අතින් සිදුවේ.

**ඉතා සුන්දර පරෙවි දූපත අනාගතය උදෙසා ආරක්ෂා කර ගැනීමට එහි පිවිසෙන සැවුරුන් මතක තබාගත යුතු කරුණකි. ඒ සඳහා පොලිතින් ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය එහි නොදැමීම මෙන් ම කොරල්පර වලට හානි නොකිරීමට ද ඔබ සැලකිලිමත් විය යුතු ය.**



පරිසරවේදී
**කුසුමසිරි විජයවර්ධන**